කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි තෙවන වසර පරීක්ෂණය (බාහිර)-2016

2022 - මැයි

**BCOM E 3045 - ජාත්‍යන්තර ආර්ථික විද්‍යාව**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයයි : (06) කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්න අංක - 01**

අ. වාණිජවාදය ලෝකයේ ප්‍රසිද්ධව පැවැතතුණු රටවල් සහ කාලවකවානු මොනවාද යන්න පිළිබඳව පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ආ. වටිනාකම පිළිබඳ ශ්‍රම න්‍යාය (labour theory of value ) යනු කුමක්ද? වටිනාකම පිළිබඳ ශ්‍රම න්‍යාය අනෙකුත් ආර්ථික විද්‍යාඥයින් විවේචනය කරන ලද්දේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්න අංක - 02**

පහත සඳහන් වෙළඳ න්‍යායන්හි විශේෂිත ලක්ෂණ පැහැදිලි කර ජාත්‍යන්තර ආර්ථික විද්‍යාවේදී විද්‍යාව අධ්‍යයනයේදී ඒවා වැදගත් වන්නේ කෙසේදැයි විස්තර කරන්න.

අ. හෙක්ස්චර් ඕලින් න්‍යාය

ආ. සාපේක්ෂ වාසි න්‍යාය

(මුළු ලකුණු 20)

**ප්‍රශ්න අංක - 03**

අ. ලෝක වෙළඳාමේදී අඩු දියුණු රටවල් සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මැදිහත් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ. පහත සඳහන් ඒවායින් ඕනෑම දෙකක් සඳහා කෙටි සටහන් ලියන්න.

i. ඛනිජ තෙල් අපනයනය කරන රටවල සංවිධානය - OPEC
ii. ලෝක වෙළඳ සංවිධානය - WTO
iii. යුරෝපා සංගමය - (E U)

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්න අංක - 04**

පහත සඳහන් මාතෘකා කෙටියෙන් පැහැදිලි කරන්න.

අ. ප්‍රපාතනය

ආ. වෙළඳ අනුපාතය

ඇ. තීරුබදු නොවන බාධක

ඉ. ජාත්‍යන්තර කාටල

(ලකුණු 5x4 = මුළු ලකුණු 20)

**ප්‍රශ්න අංක - 05**

අ. පහත සඳහන් දෑ පැහැදිලි කරන්න.

i. නම්‍ය විදේශ විනිමය අනුපාතිකය

ii. ඉදිරි විදේශ විනිමය අනුපාතිකය

(ලකුණු 12)

ආ. නම්‍ය විදේශ විනිමය අනුපාතිකය ක්‍රියාත්මක කරනු ලබන රටවල් තුනක් (03) නම් කරන්න. ජත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්ති සඳහා නම්‍ය විදේශ විනිමය අනුපාතිකය බලපාන්නේ කෙසේදැයි විවේචනාත්මකව විමසන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්න අංක - 06**

අ. "ගෝලීයකරණය" යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද ?

(ලකුණු 05)

ආ. සංවර්ධනය වෙමින් පවතින රටවල සංවර්ධන ක්‍රියාදාමය සඳහා ගෝලීයකරණය අයහපත් ලෙස බලපාන්නේ කෙසේද ? ඔබගේ පිළිතුර උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 15)

(මුළු ලකුණු 20)